ශීර්ෂය **- 406 –** පුනර්ජනනීය විදුලිබල ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

පුනර්ජනනීය විදුලිබල ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුනර්ජනනීය විදුලිබල ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 අගෝස්තු 23 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 නොවැම්බර් 30 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පුනර්ජනනීය විදුලිබල ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික

විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
| --- | --- | --- |
| 1.2.1(අ) | විදුලිබල අමාත්‍යාංශය වෙතින් ලබාගත් රු. 10,359,937 ක් වටිනා වත්කම් අයිතම 331 ක් රාජ්‍ය අමාත්‍යාංශය විසින් භාවිතයට ගනිමින් පැවතුණද, 2020 නොවැම්බර් 30 දිනැති අංක 06/2020 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව එම වත්කම් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 නොවැම්බර් 30 දිනැති අංක 06/2020 දරන අයවැය චක්‍රලේඛය ප්‍රකාරව එම වත්කම් පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කිරීම. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

#### 1.6.1.1 ආදායම් නොවන ලැබීම්

**භාණ්ඩාගාර අග්‍රිම ලැබීම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිළධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය අමාත්‍යාංශයට ලද භාණ්ඩාගාර අග්‍රිමය රු. 171,589,000 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ රු. 174,899,439 ක් ලෙස දැක්වීම හේතුවෙන් භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් රු. 3,310,439 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. 2021 වර්ෂය සඳහා අමාත්‍යාංශයට ලබා දෙන ලද අග්‍රිමය රු. 171,589,000 ක් වූ අතර එය දෙපාර්තමේන්තු පොත්වල (සිගාස්) වැරදියට ඇතුළත් කිරීම හේතුවෙන් රු. 3,310,439 ක වෙනසක් දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අතර පවතී. නව අමාත්‍යාංශයක් ලෙස ස්ථාපිත වූ මෙම අමාත්‍යාංශයේ කටයුතු නවක සේවකයන් විසින් සිදු කල අතර පලපුරුද්දක් නොමැතිකම හේතුවෙන් මෙම වැරදි සිදු වී ඇත. 2022 වර්ෂයේ සිට දෙපාර්තමේන්තු පොත්පත් ක්‍රමානුකූලව නඩත්තු කරන බව තවදුරටත් දන්වා සිටිමි. | භාණ්ඩාගාර අග්‍රිම ලැබීම් නිවැරදිව සටහන් කළ යුතු අතර අදාල වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | අතිකාල ගෙවීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ලබාගෙන තිබුණු රු.1,100,000 ක මුදල භාණ්ඩාගාර අග්‍රිම ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා තිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. අතිකාල ගෙවීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ලබා ගෙන තිබුණු රු. 1,100,000 ක මුදල භාණ්ඩාගාර අග්‍රිම ලෙස දෙපාර්තමේන්තු පොත්වල ඇතුළත් කර තිබූ අතර එම වරද නිවැරදි කිරීම සඳහා පසුව එය තැන්පතු ලෙස ඇතුළත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් සිදුකළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතවල සඳහන් එකතුව රු. 2,210,439 ක් වූ හර සටහන් 3 ක් රාජ්‍ය අමාත්‍යාංශය විසින් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ භාණ්ඩාගාර අග්‍රිම ලෙස දක්වා තිබුණද, එම සටහන්වලට අදාළ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | විගණකාධිපති නිරීක්ෂණ පහත කරුණු සමඟ සලකා බලන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. 2021 වර්ෂය සඳහා අමාත්‍යාංශයට ලබා දෙන ලද අග්‍රිමය දෙපාර්තමේන්තු පොත්වල (සිගාස්) වැරදියට ඇතුළත් කිරීම හේතුවෙන් රු. 3,310,439 ක වෙනසක් දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අතර පැවතුනි. එය මෙම හර සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. 2022 වර්ෂයේ සිට දෙපාර්තමේන්තු පොත්පත් නිසියාකාරයෙන් ක්‍රමානුකූලව නඩත්තු කරන බව තවදුරටත් දන්වා සිටිමි. | අදාල හර සටහන්වලට අදාළ ජ'නල් වවුචර විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.1.2 පුනරාවර්තන වියදම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි කුලිය රු. 17,976,441 ක් විය යුතු වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු. 24,233,472 ක් ලෙස දැක්වීමෙන් ගොඩනැගිලි කුලිය රු. 6,257,031 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ පහත කරුණු සමඟ සලකා බලන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. 2021 වර්ෂයේ පළමු කාර්තුවේ ගොඩනැගිලි කුලිය රු. 6,364,467 ක් අමාත්‍යාංශය විසින් ගෙවූ අතර දෙවන කාර්තුවේ සිට හතරවන කාර්තුව දක්වා ගොඩනැගිලි කුලිය රු. 17,869,005 ක් කැබිනට් අමාත්‍යාංශය විසින් අප අමාත්‍යාංශය වෙනුවෙන් ගෙවන ලදී. ඒ අනුව සමාලෝචිත වර්ෂ සඳහා ගොඩනැගිලි කුලිය රු. 24,233,472 ක් වන අතර එය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ නිවැරදිව දක්වා ඇත. | වෙනසට හේතු අනාවරණය කර මූල්‍ය ප්‍රකාශනවල අදාල නිවැරදි කිරීම් සිදුකළ යුතු වීම. |
| (ආ) | ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව ගමන් වියදම රු. 1,847,945 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු. 1,886,464 ක් ලෙස දැක්වීමෙන් ගමන් වියදම් රු. 38,519 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව ඉල්ලා සිටිමි. 2021 වර්ෂය සඳහා වූ ගමන් වියදම රු. 1,886,464 ක් වූ අතර එය දෙපාර්තමේන්තු පොත්වල (සිගාස්) වැරදියට ඇතුළත් කිරීම හේතුවෙන් රු. 38,519 ක වෙනසක් ඒකාබද්ධ ශේෂ පත්‍රය හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අතර පවතී. | දෙපාර්තමේන්තු පොත් සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතු වීම. |
| (ඇ) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව (එස්ඒ 10) වැඩසටහන් අංක 2 පුනරාවර්තන වියදම රු. 198,438,250 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.207,731,450 ක් ලෙස දැක්වීමෙන් එම පුනරාවර්තන වියදම රු. 9,293,200 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව (එස්ඒ 10) වැඩසටහන් අංක 2 හි සඳහන් පුනරාවර්තන වියදම නිවරැදි අතර දෙපාර්තමේන්තු පොත්වල (සිගාස්) වැරදියට ඇතුළත් කිරීම හේතුවෙන් මෙම වෙනස ඇති වී ඇත. | -එම- |

### 1.6.1.3 මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව (එස්ඒ 10) වැඩසටහන් අංක 2 හි මූලධන වියදම රු. 203,439,000 ක් වුවද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය රු. 209,717,200 ක් ලෙස, එනම් රු. 6,278,200 ක් වැඩියෙන් දක්වා තිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව (එස්ඒ 10) වැඩසටහන් අංක 2 හි සඳහන් මූලධන වියදම නිවරුදි අතර දෙපාර්තමේන්තු පොත්වල (සිගාස්) වැරදියට ඇතුළත් කිරීම හේතුවෙන් මෙම වෙනස ඇති වී ඇත. | දෙපාර්තමේන්තු පොත් සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදිකිරීම කළ යුතු වීම |

### 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

### 1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ රු. 10,205,340 ක් ලෙස දක්වා තිබුණද, භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව එම ශේෂය ශුන්‍ය අගයක් බව නිරීක්ෂණය විය. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි 2020 හා 2021 වර්ෂ වල මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් වූ රු.10,205,340ක් පමණක් සිගාස් පද්ධතියට ඇතුළත් කර ඇති අතර එය සිගාස් වෙබ් පිටුව වෙත ඇතුළත් කර නොමැති බැවින් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතයෙහි වත්කම් ශේෂය ශුන්‍ය අගයක් ගනියි. සිගාස් පද්ධතියට ඇතුළත් කර ඇති වත්කම් සිගාස් වෙබ් පිටුව වෙත ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි. | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය නිවැරදි වාර්තා කිරීම් සිදු කළ යුතු වීම. |
| (ආ) | 2020 වර්ෂයේ මිලදී ගෙන තිබුණු රු. 325,000 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි 2020 දෙසැම්බර් 24 දින ලේකම් අංශය සඳහා රු. 325,000ට මිලදී ගන්නා ලද ලැප්ටොප් පරිගණකය 2022 වර්ෂයේ දී සිගාස් පද්ධතියට ඇතුළත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතු වීම. |
| (ඇ) | වාහන පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම සඳහා දරා තිබුණු රු. 3,242,150 ක වියදම ස්ථාවර වත්කම් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. පුනරාවර්තන වැය විෂයක් යටතේ මේ සඳහා පරිපූරක ඇස්තමේන්තුවක් හරහා ප්‍රතිපාදන ලබා ගෙන ගෙවීම් සිදු කර ඇත. මෙම වරද ඉදිරියේදී නැවත සිදු නොවන බව කාරුණිකව දන්වා සිටිමි. | -එම- |
| (ඈ) | බාහිර ආයතන වෙතින් ලබාගත් වත්කම් අයිතම 471 ක් රාජ්‍ය අමාත්‍යාංශය විසින් භාවිතා කරමින් පැවතුණද විධිමත්ව පවරාගෙන ගිණුම් ගත කර නොතිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි.වත්කම් සත්‍යාපන කමිටු වාර්තාව පදනම් කර ගනිමින් වත්කම් අමාත්‍යාංශය වෙත පවරා ගෙන ගිණුම් ගත කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | වත්කම් විධිමත්ව පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඉ) රු. 79,500 ක් වටිනා වත්කමක් දෙවරක් සටහන් වීමෙන් වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි . | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. සොෆ්ට් ලයින් ට්‍රේඩ් ඇන්ඩ් සර්විස් ආයතනයෙන් දෙසැම්බර් මස මිලදී ගන්නා ලද රු. 79,500ක වත්කම් දෙවරක් සටහන් කර ඇති අතර එය බැංකු සැසඳුම් ප්‍රකාශය තුළ ගෙවීම් නොකල චෙක්පත් ලැයිස්තුව තුලද පවතී. එය 2022 ජුලි මස බැංකු සැසඳුම් ප්‍රකාශය මඟින් නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතු වීම. |

**1.6.2.2 මූල්‍ය වත්කම්**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් සමාලෝචිත වර්ෂයේ අප්‍රේල් මස ලැබී තිබුණු රු. 1,100,000 ක් අප්‍රේල් සහ ජුලි මාසවලදී මුදල් ලැබීම් ලෙස දෙවතාවක් මුදල් පොතේ සටහන් කර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් මුදල් ශේෂය වැඩියෙන් දක්වා තිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. අතිකාල ගෙවීම සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් ලබාගෙන තිබුණු රු. 1,100,000 ක මුදල භාණ්ඩාගාර අග්‍රිම ලෙස දෙපාර්තමේන්තු පොත් වල ඇතුළත් කර තිබූ අතර පසුව එය නිවැරදි කර තැන්පතු ලෙස ඇතුළත් කර ඇත. ඒ හේතුවෙන් අප්‍රේල් සහ ජුලි මාසවල දී මුදල් ලැබීම් ලෙස දෙවතාවක් මුදල් පොතේ සටහන් කර ඇත. | දෙපාර්තමේන්තු පොත් සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය නිවැරදි කිරීම් කළ යුතු වීම. |
| (ආ) 2021 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව ශේෂය රු. 3,223,860 ක් වුවත් බැංකු සැසඳුම් ප්‍රකාශයේ ශුන්‍ය අගයක් ලෙස දක්වා තිබුණි. එසේම, රු. 14,163,316 ක ගෙවීම් හඳුනාගෙන මුදල් පොත සංශෝධනය කර නොතිබුණු අතර, එම ගෙවීම් හඳුනා නොගත් ගෙවීම් ලෙස බැංකු සැසඳුමේ දක්වා තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශය අනුව ශේෂය රු. 66,894,106 ක් වුවත්, බැංකුවට ඉදිරිපත් නොවූ නමුත් නිකුත් කර තිබූ චෙක්පත්වල වටිනාකම රු. 77,995,591 ක් වීමෙන් බැංකු ශේෂය ඉක්මවා රු. 11,101,485 ක චෙක්පත් නිකුත් කර තිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. දෙපාර්තමේන්තු පොත්වල (සිගාස්) වැරදියට අග්‍රිම ලැබුණු ආකාරයට දත්ත ඇතුළත් කිරීම හේතුවෙන් රු. 3,223,860 ක වෙනසක් දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අතර පැවතුණි. නමුත් සිගාස් පද්ධතියේ පැවති දෝෂයක් හේතුවෙන් එය දෙපාර්තමේන්තු පොත් වලින් නිවැරදි කිරීමට කටයුතු කළ නොහැකි විය. එබැවින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් පරිදි 2021 දෙසැම්බර් මසදී වියදම් කපා හැරීම මඟින් අමාත්‍යාංශය වෙනුවෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන අග්‍රිම ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරන ලදී. | හඳුනා නොගත් ගෙවීම් හඳුනාගෙන සංශෝධිත මුදල් ශේෂය නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වීම. |

### 1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය ශුන්‍ය වුවත් මුදල් පොත අනුව එදිනට ශේෂය රු. 3,223,860 ක් විය. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. 2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත අනුව ශේෂය ශුන්‍ය අතර මුදල් පොතේ ශේෂය රු. 3,223,860 කි. දෙපාර්තමේන්තු පොත්වල (සිගාස්) වැරදියට අග්‍රිම ලැබුණු ආකාරයට දත්ත ඇතුළත් කිරීම හේතුවෙන් රු. 3,223,860 ක වෙනසක් දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අතර පැවතුණි. නමුත් සිගාස් පද්ධතියේ පැවති දෝෂයක් හේතුවෙන් එය දෙපාර්තමේන්තු පොත් වලින් නිවැරදි කිරීමට කටයුතු කල නොහැකි විය. එබැවින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් පරිදි 2021 දෙසැම්බර් මසදී වියදම් කපා හැරීම මඟින් අමාත්‍යාංශය වෙනුවෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන අග්‍රිම ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරන ලදී. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කළ යුතු වීම. |

### 1.6.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 08 දින රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවීමෙන් පසුව විදුලිබල අමාත්‍යාංශයේ සේවය කරන ලද නිලධාරීන් 24 ක් රාජ්‍ය අමාත්‍යාංශයට අනුයුක්ත කර තිබුණු අතර එම නිලධාරීන්ගෙන් 18 දෙනෙකුගේ ණය හා අත්තිකාරම් ශේෂය රු. 3,371,186 ක් විය. නමුත් මෙම ණය හා අත්තිකාරම් ලබා දීමට අදාළ අයදුම්පත් ඇතුළු ලේඛන රාජ්‍ය අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් නොකළ අතර, රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවීමට පෙර විදුලිබල අමාත්‍යාංශය හරහා විවිධ නිලධාරීන්ට ණය හා අත්තිකාරම් නිකුත් කළ දිනයන් ඇතුළු තොරතුරු කිසිවක් රාජ්‍ය අමාත්‍යාංශය සතුව නොතිබුණි. ඒ අනුව ණය හා අත්තිකාරම් සම්බන්ධයෙන් පැණ නඟින ගැටලු (ණය නොගෙවීම්, ඇපකරුවන්, විශ්‍රාම යාම, සේවයෙන් ඉවත් වීම යනාදී) සම්බන්ධව ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 3 උපවගන්තිය ප්‍රකාරව කටයුතු කිරීමේදී ගැටළු ඇති විය හැකි බව නිරීක්ෂණය විය. | විගණකාධිපති නිරීක්ෂණ පහත කරුණු සමඟ සලකා බලන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. 2020 අගෝස්තු 08 දින රාජ්‍ය අමාත්‍යාංශය පිහිටුවනු ලැබුවද එම වර්ෂයේ දෙසැම්බර් දක්වා මෙම අමාත්‍යාංශයේ ගිණුම් කටයුතු සිදුකරනු ලැබුවේ විදුලිබල අමාත්‍යාංශයේ ගිණුම් අංශය විසිනි. ඒ අනුව විදුලිබල අමාත්‍යාංශයේ සිට රාජ්‍ය අමාත්‍යාංශයට ස්ථාන මාරු කළ නිලධාරීන් 2020 අගෝස්තු 08 සිට ලබා ගත් ණය සහ අත්තිකාරම් වලට අදාළ අයදුම්පත් විදුලිබල අමාත්‍යාංශයෙන් ගෙන්වා ගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. | අවශ්‍ය ලේඛණ විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.5 අග්‍රිම ශේෂය

| විගණන නිරීක්ෂණය | ගණනන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (එස්ජ් 70) අනුව අග්‍රිම ගිණුමේ සමුච්චිත හර ශේෂය රු. 174,899,439 ක් වුවත් ඒකාබද්ධ ශේෂ පත්‍රයේ එය රු. 176,421,489 ක් ලෙස රු.1,522,050 කින් වැඩියෙන් දක්වා තිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. 2021 වර්ෂයේ භාණ්ඩාගාර මුද්‍රිත (එස් ඒ 70) අනුව අග්‍රිම ගිණුමේ සමුච්චිත හර ශේෂය රු. 174,899,439 ක් වන අතර ඒකාබද්ධ ශේෂ පත්‍රයේ එය රු. 176,421,489 ක් ලෙස දැක්වේ. දෙපාර්තමේන්තු පොත්වල (සිගාස්) අග්‍රිම ලැබීම් වැරදියට ඇතුළත් කිරීම හේතුවෙන් රු.1,522,050 ක වෙනසක් දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අතර පවතී. නමුත් සිගාස් පද්ධතියේ පැවති දෝෂයක් හේතුවෙන් එය දෙපාර්තමේන්තු පොත් වලින් නිවැරදි කිරීමට කටයුතු කළ නොහැකි විය. එබැවින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් පරිදි 2021 දෙසැම්බර් මසදී වියදම් කපා හැරීම මඟින් අමාත්‍යාංශය වෙනුවෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන අග්‍රිම ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරන ලදී. | අදාල වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතු වීම. |

### 1.6.6 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

රාජ්‍ය අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛණ පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛණ විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නයැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණනන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 446හි සඳහන් විධිවිධාන ප්‍රකාරව මුදල් පොත විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගෙන නොතිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි අතර 2022 වර්ෂයේ සිට විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගෙන යනු ලැබේ. | මුදල් රෙගුලාසි 446හි සඳහන් විධිවිධාන ප්‍රකාරව මුදල් පොත විධිමත්ව හා යාවත්කාලීනව පවත්වාගත යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර එහි 11 වැනි පරිශිෂ්ටයෙහි පරිදි ස්ථාවර වත්කම් ලේඛනය අදාල වන පරිදි විගණකාධිපතිගේ එකඟත්වය ඇතිව පවත්වාගත යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 451 ප්‍රකාර චෙක්පත්, මුදල් ඇණවුම් ලේඛණයක් පවත්වා නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 451 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ජී.ඒ.එම්. 83 දරන පෝරමය පරිදි ලැබෙන චෙක්පත්, මුදල් ඇණවුම් සටහන් කර ගැනීමට හැකි වන පරිදි ලේඛනයක් පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කල හැකි වන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. |
| (ඉ) | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 110 විධිවිධාන ප්‍රකාරව ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (ඊ) | මුදල් රෙගුලාසි 502 ප්‍රකාරව රජයේ නිලධාරින්ගේ ණය හා අත්තිකාරම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 502 ප්‍රකාරව රජයේ නිලධාරින්ගේ ණය හා අත්තිකාරම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |
| (උ) | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතු වීම. |
| (ඌ) | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් පරිදි රජයේ ගොඩනැගිලි වල සියලුම විදුලි උපාංග හා උපකරණ පිළිබඳ බඩු ලේඛන පොතක් පවත්වා ගත යුතුය. |
| (එ) | මුදල් රෙගුලාසි 454(3) ප්‍රකාරව පොත් නාමාවලියක් පවත්වා ගෙන නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 454(3) ප්‍රකාරව පොත් නාමාවලියක් පවත්වාගත යුතුය. |
| (ඒ) | මුදල් රෙගුලාසි 454(1) ප්‍රකාරව බඩු ලේඛන පොතක් පවත්වා නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 454(1)හි විධිවිධාන ප්‍රකාරව 44 වැනි පොදු ආකෘතිය පරිදි බඩු ලේඛන පොතක් යාවත්කාලීන කර පවත්වා ගත යුතුය. |
| (ඔ) | මුදල් රෙගුලාසි 751 හා 763 ප්‍රකාරව තොග පොත් පවත්වා නොතිබුණි. | -එම- | මුදල් රෙගුලාසි 751 හා 763 ප්‍රකාරව තොග පොත් පවත්වා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය අමාත්‍යාංශය විසින් අග්‍රිම නිසි පරිදි කළමනාකරණය නොකිරීම හේතුවෙන් පෙබරවාරි, මාර්තු, අප්‍රේල් සහ සප්තැම්බර් මාසවල අග්‍රිම ගිණුමේ ශේෂය සෘණ අගයක් ගෙන තිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. දෙපාර්තමේන්තු පොත්වල (සිගාස්) අග්‍රිම ලැබීම් වැරදියට ඇතුළත් කිරීම හේතුවෙන් පෙබරවාරි, මාර්තු, අප්‍රේල් සහ සැප්තැම්බර් මාසවල අග්‍රිම ගිණුමේ ශේෂය සෘණ අගයක් ගෙන තිබුණි. නමුත් සිගාස් පද්ධතියේ පැවති දෝෂයක් හේතුවෙන් එය දෙපාර්තමේන්තු පොත් වලින් නිවැරදි කිරීමට කටයුතු කල නොහැකි විය. එබැවින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් පරිදි 2021 දෙසැම්බර් මසදී වියදම් කපා හැරීම මඟින් අමාත්‍යාංශය වෙනුවෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන අග්‍රිම ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරන ලදී. | අග්‍රිම නිසි පරිදි කළමනාකරණය කළ යුතු වීම. |

### 2.2 වියදම් කළමනාකරණය

#### 2.2.1 වියදම් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වුවත් එසේ කටයුතු නොකිරීම මත රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයට අදාළව පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම මඟින් වැය විෂයයන් 02 ක් සඳහා එකතුව රු. 9,500,000 ක අතිරේක ප්‍රතිපාදන ලබාගෙන තිබූ අතර, එය ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය සමඟ සැසඳීමේ දී සියයට 28 සිට 438 දක්වා විය. තවද, ගොඩනැගිලි කුලී වෙනුවෙන් රු. 46,700,000 ක ප්‍රතිපාදන වෙන් කරවා ගෙන පසුව ඉන් රු. 11,474,000 ක් වෙනත් වැය විෂයන් සඳහා මාරු කර තිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ පහත තත්ත්වයන් සමඟ සලකා බලන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. 2020 වර්ෂයේ නව අමාත්‍යාංශයක් ලෙස මෙම අමාත්‍යාංශය පිහිටු වීමෙන් පසු එම වර්ෂයේ මාස කිහිපයක පැවති වියදම් පදනම් කර ගෙන 2021 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තු පිළියෙළ කිරීම සිදු විය. මෙය නව අමාත්‍යාංශක් වීම හා වෙන්වී තිබූ ප්‍රග්ධන ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අවශ්‍ය ස්ථාවර වත්කම් මිල දී ගැනීම සඳහා හා ගරු රාජ්‍ය අමාත්‍යවරයාගේ නිල රථයේ අලුත්වැඩියා කටයුත්තක් වෙනුවෙන් මෙම අතිරේක ප්‍රතිපාදන ලබා ගෙන ඇත. 2021 වර්ෂය සඳහා ගොඩනැගිලි කුලී ලෙස රු. 46,700,000 ක ප්‍රතිපාදනයක් වෙන් වී තිබුණි. නමුත් මෙම අමාත්‍යාංශය හා විදුලිබල අමාත්‍යාංශය එකම ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාම හේතු කොට ගෙන ගොඩනැගිලි කුලියෙන් 1/3 ක ප්‍රමාණයක් පමණක් රාජ්‍ය අමාත්‍යාංශය ගෙවීම සඳහා භාවිතා කරන ඉඩ ප්‍රමාණය පදනම් කර ගෙන විදුලිබල අමාත්‍යාංශය එකඟ විය. එම නිසා ගොඩනැගිලි වැය විෂයේ ප්‍රතිපාදන ඉතිරි වූ අතර එම ප්‍රතිපාදනයන්, නිසි අනුමැතිය යටතේ ප්‍රතිපාදන හිඟ වැය විෂයන් සඳහා මාරු කර ගනිමින් උපයෝජනය කර ඇත. | වියදම් අවම වන ආකාරයෙන් සහ නිවැරදිව ඇස්තමේන්තු සකස්කළ යුතු වීම. |

### 2.2.2 ප්‍රතිපාදන ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයයන් 3 ක් සඳහා සලසා ගෙන තිබූ රු. 850,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනවලින් සියයට 100 ක් හා තවත් වැය විෂයයන් 16 ක් සඳහා සලසාගෙන තිබූ රු. 451,175,995 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනවලින් සියයට 12 සිට සියයට 79 ක් දක්වා ප්‍රමාණයක් උපයෝජනය කර නොතිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. රටේ පැවති කොවිඩ් වසංගත තත්වය මත පැනවූ සංචරණ සීමා හේතුවෙන් අවම සේවක මණ්ඩලයක් සේවයට වාර්තා කල අතර ආයතන වල වියදම් සීමා කිරීමට සිදු විය. තවද වරින් වර නිකුත් කරන ලද චක්‍රලේඛ පදනම්ව ඇතැම් වියදම් සීමා කරන ලදී. මේ හේතුවෙන් ලබා දී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත්ව උපයෝජනය කිරීමට නොහැකි විය. | ප්‍රතිපාදන කාර්යක්ෂමව සහ ඵලදායීව උපයෝජනය කළ යුතු වීම. |

### 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අමාත්‍යාංශයේ රු. 323,722 ක බැරකම්, බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණු අතර, රු. 101,682 ක ඉතිරි ප්‍රතිපාදන රු. 26,367 කින් ඉක්මවා රු. 128,049 ක බැරකම්වලට එළඹ තිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදිය. 2022 වර්ෂයේදී පවත්නා ප්‍රතිපාදන ප්‍රමාණයන් සඳහා පමණක් බැරකම් සඳහා එළඹීමට කටයුතු යොදා ඇත. | ප්‍රතිපාදන සීමා තුල වියදම් දැරිය යුතු වීම. |

### 2.4 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ ක්‍රියාත්මක ග්‍රාමීය ප්‍රදේශවල අඩු ආදායම්ලාභී පවුල් සඳහා විදුලි පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය සඳහා විදුලිබල අමාත්‍යාංශය විසින් වියදම් ප්‍රතිපූරණය පදනමින් රාජ්‍ය අමාත්‍යාංශය වෙත රු. 43,900,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. වියදම් ප්‍රතිපූරණ වවුචර්පත් 2021 දෙසැම්බර් 10 දිනට එවිය යුතුව තිබුණද එසේ එවා නොතිබූ අතර, එදිනට පසුව එනම් 2021 දෙසැම්බර් 24 දිනදීද තවත් රු. 12,637,200 ක අතිරේක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ පහත කරුණු සමඟ සලකා බලන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ගම සමඟ පිළිසඳරක් වැඩ සටහන යටතේ ජාලගත නොවූ (Off-Grid) තාක්ෂණය ඔස්සේ විදුලි පහසුකම් ලබා දීමට ඇස්තමේන්තුගත පිරිවැය ලෙස රු.මිලියන 43.9ක ප්‍රතිපාදන වෙන් කර දෙන මෙන් සූර්ය බල සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙතින් ඉල්ලා තිබූ අතර ඒ අනුව විදුලිබල අමාත්‍යතුමාගේ අනුමැතිය පරිදි අදාළ ප්‍රතිපාදන වෙන්කරන ලදී. එහෙත්, අංක SEA/RES-1/21/W-1 හා 2021 ඔක්තොම්බර් 04 දිනැති ලිපිය අනුව රු.මිලියන 43.9 ක් වූ මූලික අයවැය ප්‍රතිපාදනය, සාකච්ඡා කළ අවසාන මිලට | වියදම් ප්‍රතිපූර්ණ වවුචර්පත් අදාල කාලය තුල ලබාගත යුතු ඊට පසු ප්‍රතිපාදන ලබා දීම නොකල යුතු වීම . |

| | | | |
|---|---|---|---|
| | | (Negotiated Final Report) වඩා රු. 12,637,200 ක මුදලකින් වැඩි බැවින් එම අතිරේක මුදල ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා තිබුණි. ඒ අනුව විදුලිබල අමාත්‍යාංශය විසින් රාජ්‍ය අමාත්‍යාංශය වෙත අදාළ මුළු මුදල වූ රු. 56,537,200 ක මුදල, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදනය ලබා දෙන ලදි. එහෙත් රාජ්‍ය අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත රු. 52,435,474 ක මුදලක් පමණක් මුදලින් ගෙවීම් කර ඇත. | |
| (ආ) | කළ වැඩවලට අදාල බිල්පත් ලබා ගැනීමකින් තොරව සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ඉදිරිපත් කර තිබුණු රු. 56,537,200 ක නාමමාත්‍රික බිල්පතක් (Performa invoice) වෙනුවෙන් රාජ්‍ය අමාත්‍යාංශය විසින් රු. 52,435,474 ක් ගෙවා තිබුණි. මු.රෙ. 145(3) ප්‍රකාරව විදුලිබල අමාත්‍යාංශය (මූලිකයා) වෙනුවෙන් රාජ්‍ය අමාත්‍යාංශය නියෝජිතයා වශයෙන් ක්‍රියා කළ යුතු වුවත්, රාජ්‍ය අමාත්‍යාංශය විසින් එම ප්‍රතිපාදන තවත් නියෝජිතයෙකු (සුනිත්‍ය බලශක්ති අධිකාරිය) වෙත ලබා දීම මුදල් රෙගුලාසිවලට පටහැනි බව නිරීක්ෂණය විය. මෙම ප්‍රතිපාදනය සම්බන්ධයෙන් මු.රෙ.146(අ) සහ (ආ) ප්‍රකාරව වැඩෙහි සැලැස්ම සහ එහි ප්‍රගතිය සහ වියදම් සහ වර්ෂය අවසානයේදී අදාළ වැඩවල කොටසක් නිම නොවී ඉතිරිවේද යන්න සම්බන්ධයෙන් සොයා බැලීමේ වගකීම විදුලිබල අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉටු කර නොතිබුණි. මේ සඳහා 2021 දෙසැම්බර් 31 දින චෙක්පත් ලියා 2022 වර්ෂයේ ජනවාරි 25 දින ගෙවීම් කර තිබුණි. භාණ්ඩාගාරය විසින් ලබා දී තිබුණු අග්‍රිමයෙන් ඉතිරි රු. 4,101,526 ක මුදල භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ පහත කරුණු සමඟ සලකා බලන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. ගම සමඟ පිළිසඳර වැඩ සටහන යටතේ ගලමුදුන ග්‍රාමයට විදුලිය සැපයීම සම්බන්ධ ප්‍රගතිය සම්බන්ධයෙන් වාර්තාවක් සපයන ලෙස සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍යාංශය විසින් 2022/03/23 දරන ලිපියෙන් රාජ්‍ය අමාත්‍යාංශය වෙත දන්වා තිබූ අතර ඒ අනුව මීමුරේගල ග්‍රාමයට විදුලිය ලබා දීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ලබා දෙන මෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත දැනුවත් කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් අදාල ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් රාජ්‍ය අමාත්‍යාංශයටද පිටපත් සහිතව සංවර්ධන සම්බන්ධීකරණ හා අධීක්ෂණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. එම ප්‍රගති වාර්තාවට අනුව ගල මුදුන බලාගාරයේ ඉදිකිරීම්, නිවාස වයරින් වැඩ හා විදුලිය බෙදාහැරීමේ මාර්ග ඉදිකිරීම් අරඹා ඇති බව දක්වා ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඇ) ගම සමඟ පිළිසඳරක් වැඩසටහන යටතේ ග්‍රාමීය ප්‍රදේශවල අඩු ආදායම් ලාභී පවුල් සඳහා විදුලි පහසුකම් වැඩි දියුණු කිරීම යන වැය විස්තරය යටතේ වව්නියාව බෝගස්වැව සපුමල්කඳවල රජමහා විහාරයට විදුලි පහසුකම් ලබාදීමේ වියදම් ප්‍රතිපූරණය නමින් රාජ්‍ය අමාත්‍යාංශය විසින් සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත රු. 4,955,000 ක් ගෙවා තිබුණද, අදාල විදුලි පහසුකම් සැපයීමේ කොන්ත්‍රාත් වැඩ ඉටු කල බවට සනාථ කළ හැකි කිසිඳු ලියවිල්ලක් වවුචරය සමඟ ඉදිරිපත් කර නොතිබුණි. මෙම ප්‍රතිපාදනය සම්බන්ධයෙන් මු.රෙ.146(අ) සහ (ආ) ප්‍රකාරව වැඩෙහි සැලැස්ම, එහි ප්‍රගතිය හා වියදම් සහ වර්ෂය අවසානයේදී අදාළ වැඩවල කොටසක් නිම නොවී ඉතිරිවේද යන්න සම්බන්ධයෙන් සොයා බැලීමේ වගකීම විදුලි බල අමාත්‍යාංශය සහ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉටු කර නොතිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ පහත කරුණු සමඟ සලකා බලන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.ගම සමඟ පිළිසඳර වැඩසටහන යටතේ වවුනියාව බෝලස්වැව සපුමල් කඳවල රජමහා විහාරයට විදුලිය සැපයීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ලබා දෙන මෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත දැනුවත් කරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් අදාල ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. එමඟින් විහාරස්ථානය සඳහා සූර්ය බල පද්ධතියට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මඟින් ප්‍රසම්පාදන කටයුතු අවසන් කර විදුලිය ලබාදීම සිදු කර ඇති බව හා මාර්ග ආලෝක සඳහා සූර්ය බලයෙන් ක්‍රියාකරන විදී ලාම්පු 15 සවි කිරීම සිදු කර ඇති බවත්, මේ යටතේ කිලෝවොට් 5ක් ධාරිතාව සහිත කිලෝවොට් පැය 10 යුතු බැටරි ගබඩා පහසුකම් සහිත සූර්ය බල පද්ධතිය විහාරස්ථානය වෙත බාර දී ඇති බවත් වාර්තා කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| **නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු වේ. එසේම, සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට සක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදිය. අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යන බව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික කරමින් හා මූල්‍ය පද්ධතියේ සඵලදායිබව පිළිබඳ සිදු කරන ලද සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය<br>---------------<br>නීති, රීති හා රෙගුලාසිවලට යොමුව<br>--------------------------- | <br><br>අනුකූල නොවීම<br>------------------ | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම<br>------------------------------ | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 1.4 වගන්තිය | අතිකාල වියදම් සුපරීක්ෂකාරීවත්, නොකඩවාත් පාලනය කිරීමට ලේකම්වරයෙකු හා දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු විසින් අවශ්‍ය සෑම පියවරක්ම ගත යුතු වුවද, රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේදී අතිකාල සඳහා වෙන්කර තිබුණු රු. 4,000,000 ක මූලික ප්‍රතිපාදනද ඉක්මවා රු. 5,261,389 ක් වැය කර තිබුණි. සමස්ථ කාර්ය මණ්ඩලයෙන් සියයට 43 ක් වූ අමාත්‍ය කාර්යමණ්ඩලය සඳහා රු.3,748,039 ක අතිකාල ගෙවා තිබුණු අතර එය මුළු අතිකාල වියදමින් සියයට 71 ක් බව නිරීක්ෂණය විය. | විදුලි උත්පාදනය සඳහා පුනර්ජනනීය විදුලිබල උත්පාදන ප්‍රභවයන් වෙත අවධානය යොමු වීම මත රාජ්‍ය අමාත්‍යාංශය සඳහා විශාල වගකීමක් පැවරුණු අතර එම කටයුතු වෙනුවෙන් මෙම අතිකාල දීමනා ගෙවීම් සිදු කර ඇත. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මු.රෙ. 103(1) | වත්කම් සත්‍යාපනයේදී හඳුනාගත් භාණ්ඩ අයිතම 73 ක ඌණතා සම්බන්ධයෙන් රාජ්‍ය අමාත්‍යාංශය විසින් අවශ්‍ය පරිදි කටයුතු කර නොතිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි බව කාරුණිකව දන්වා සිටිමි. වත්කම් සත්‍යාපන කමිටු වාර්තාව පදනම් කර ගනිමින් පවතින ඌනතාවයන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ii) මු.රෙ. 137 | වියදම් අනුමත කිරීමේදී අදාළ සේවාවන් වැඩ හෝ සැපයුම් නිසි ප්‍රමිතියෙන් සම්පූර්ණ විය යුතු වුවත්, රාජ්‍ය අමාත්‍යාංශය විසින් සැපයුම් නිසි ප්‍රමිතියෙන් සම්පූර්ණ වීමට පෙර වියදම් අනුමත කර 2020 දෙසැම්බර් 31 දින රු.1,486,252 ක චෙක්පතක් ලියා තිබුණි. එසේම, 2021 වර්ෂයේදී අදාළ භාණ්ඩ නිසි ප්‍රමිතියට හා පිරිවිතරවලට පටහැනිව ලැබී තිබූ | නව අමාත්‍යාංශයක් ලෙස ස්ථාපිත වූ මෙම අමාත්‍යාංශයේ කටයුතු කඩිනමින් ආරම්භ කිරීමට සිදු වූ බැවින් රාජ්‍ය ආයතනයක් වූ ශ්‍රී ලංකා වාණිජ නීති ගත සංස්ථාවෙන් අවශ්‍ය ස්ථාවර වත්කම් ඍජු මිලදී ගැනීම් සිදු කර ඇත. රාජ්‍ය ආයතනයකට ගෙවීම් කිරීමට ඇති මුදලක් බැවින් එම | -එම- |

| | | | |
|---|---|---|---|
| | බැවින් ප්‍රතික්ෂේප කරන ලද බව රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා තිබූ අතර, පසුව එම භාණ්ඩම මිලදී ගෙන තවත් රු. 1,327,060 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | වවුචර්පත අනුමත කර එම මුදල සඳහා චෙක්පතක් ලියා වෙන් කර තිබූ නමුත් ලැප්ටොප් යන්ත්‍රයන් හී ඇති වූ දෝෂ හේතුවෙන් සැපයුම්කරු වෙත නැවත බාර දීමට අදාල ලිපි යොමු කරන ලදි. එම ලිපි වලට පිළිතුරු වශයෙන් සැපයුම්කරුගේ නියෝජිතයන් කිහිපවරක් පැමිණ අදාල දෝෂයන් නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගත් අතර වසරකට ආසන්න කාලයක් භාවිතා කරන ලද වත්කම් සඳහා ගෙවීම් කිරීම සිදු 2021 වසරේ දෙසැම්බර් මසදී සිදු කර ඇත. එහිදී රු. 1,486,252 ක් වටිනා වත්කම් වලින් රු. 159,192 ක් වටිනා ඒසී යන්ත්‍රය නැවත ආපසු හරවා යැවූ බැවින් රු. 1,327,060 ක් වටිනා වත්කම් සඳහා පමණක් මුදල් ගෙවීම් සිදු කර ඇත. | |
| (iii) මු.රෙ. 396 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වලංගු කාලය අවසන් වී තිබූ රු. 3,856,161ක් වූ චෙක්පත් 34 ක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි අතර 2022 වර්ෂයේ සිට නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | -එම- |
| (iv) මු.රෙ. 756(6) | 2021 දෙසැම්බර් 15 දිනට පෙර භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත්කර නොතිබුණි. එසේම, මු.රෙ. අනුව දක්වා ඇති කාල රාමුව තුළ සෑම අමාත්‍යාංශයක්ම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කළ යුතු වුවත්, රාජ්‍ය අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයේ අවසාන කාර්තුවේ මෙම අමාත්‍යාංශය නව අමාත්‍යාංශයක් ලෙස පිහිටුවන ලදී. 2021 වර්ෂයේ පවතින වත්කම් හඳුනා ගැනීම සඳහා වත්කම් සත්‍යාපන කමිටුවක් පත් කරන ලද අතර 2021.11.10 වන දින 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයක්ද පත් කර ඇත. මේ වන විට ලැබී ඇති වත්කම් සත්‍යාපන කමිටු වාර්තාවට අනුව භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඈ) 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 05 හා 07 වගන්ති | රාජ්‍ය අමාත්‍යාංශය සතු වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම, ආයතන විසින් මිලදී ගත් වත්කම් සම්බන්ධව තොරතුරු කාර්තුමය පදනමින් කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට යැවිය යුතු වුවත්, 2021 වර්ෂයේ මිලදී ගන්නා ලද රු. 8,881,840 ක් වටිනා වත්කම් පිළිබඳ වාර්තා කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට යැවීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශය සතු වත්කම් පිළිබඳ තොරතුරු කොම්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |
| (ඈ) 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | විදුලිබල අමාත්‍යාංශය විසින් රාජ්‍ය අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණු වාහන 12 ක් විගණිත දිනය දක්වාම විධිමත්ව රාජ්‍ය අමාත්‍යාංශය වෙත පවරාගෙන නොතිබුණි. | එම රථ වාහන පවරා ගැනීම සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතින අතර ඒ සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනීම ආදී මූලික කටයුතු සිදු කර ඇත.මේ වන විට රාජ්‍ය අමාත්‍යවරයකු හෝ ලේකම්වරයකු නොමැති වුව ද අමාත්‍යාංශයේ කාර්යයන් හා කර්තව්‍යයන් සිදු කරනු ලබයි.එසේ වුව ද මෙම රාජ්‍ය අමාත්‍යාංශය විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශයට එක් කිරීමක් මෙතෙක් සිදුව නොමැත.මෙම අවිනිශ්චිත වතාවරණයන් හේතුවෙන් පවරා ගැනීම සම්බන්ධයෙන් ගැටළුවක් පවතී. | -එම- |
| (ඉ) 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 06 හි 2.1 ඡේදය | 2021 දෙසැම්බර් 31 දිනට රු. 3,223,860 ක් වූ මුදල් ශේෂය සම්බන්ධයෙන් මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කර භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර නොතිබුණි | 2021 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර මුද්‍රිත අනුව ශේෂය ශුන්‍ය අතර මුදල් පොතේ ශේෂය රු.3,223,860 කි. දෙපාර්තමේන්තු පොත්වල (සිගාස්) වැරදියට අග්‍රිම ලැබුණු ආකාරයට දත්ත ඇතුළත් කිරීම හේතුවෙන් රු. 3,223,860 ක වෙනසක් දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අතර පැවතුණි.නමුත් සිගාස් පද්ධතියේ පැවති දෝෂයක් හේතුවෙන් එය | -එම- |

| | | | |
|---|---|---|---|
| | | දෙපාර්තමේන්තු පොත් වලින් නිවැරදි කිරීමට කටයුතු කල නොහැකි විය. එබැවින් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් පරිදි 2021 දෙසැම්බර් මසදී වියදම් කපා හැරීම මගින් අමාත්‍යාංශය වෙනුවෙන් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් පවත්වා ගෙන යනු ලබන අග්‍රිම ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරන ලදී. | |
| (ඊ) 2021 නොවැම්බර් 26 දිනැති 03/2021 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශය | | | |
| (i) 3.1 ඡේදය | **CIGAS** යෙදුම මගින් උත්පාදිත ශේෂ පිරික්සුම (ඒකාබද්ධ ශේෂ පත්‍රය) ඇමුණුමක් ලෙස මූල්‍ය ප්‍රකාශන කට්ටලයට ඇතුළත් කර නොතිබුණි. | විගණකාධිපති නිරීක්ෂණ නිවැරදි අතර අතපසු වීමකින් CIGAS යෙදුම මගින් උත්පාදිත ශේෂ පිරික්සුම (ඒකාබද්ධ ශේෂ පත්‍රය) ඇමුණුමක් ලෙස මූල්‍ය ප්‍රකාශන කට්ටලයට ඇතුළත් කර නොතිබුණි. | -එම- |
| (ii) 8.3 ඡේදය | තැන්පතු සඳහා සැසඳීමේ ප්‍රකාශයක් පිළියෙළ කර 2022 පෙබරවාරි 28 දිනට පෙර විගණකාධිපති වෙත පිටපත් සහිතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත් රාජ්‍ය අමාත්‍යාංශය එලෙස තැන්පතු සඳහා සැසඳීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | සෑම මසකම මාසික ගිණුම් සාරාංශවල මෘදු පිටපත් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන අතර එමගින් තැන්පතු සඳහා සැසඳීම් ප්‍රකාශයක් ලබා ගත හැකිය.තැන්පතු සඳහා සැසඳීම් ප්‍රකාශයක් පිළියෙළ කර විගණකාධිපති වෙත පිටපත් සහිතව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත 2022 ජූනි මස සිට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත. | -එම- |

## 2.7 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු ඇතැම් ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

| | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශ ලේකම්ගේ ලිඛිත අනුමැතියකින් තොරව රාජ්‍ය අමාත්‍යාංශයේ ගණකාධිකාරී විසින් රාජ්‍ය අමාත්‍යාංශයේ අතිකාල වියදම් සඳහා ගෙවීම් කිරීමට සුනිත්‍ය බලශක්ති අධිකාරියෙන් නැවත ගෙවීමේ පදනමට 2021 අප්‍රේල් 12 දින රු. 1,100,000 ක මුදලක් ලබාගෙන තිබුණි. | මෙම මුදල සම්බන්ධ ගැටළුව 2022.05.31 දින නිරාකරණය කර ඇති අතර ඉදිරියේදී ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ නිසි අනුමැතියක් ලබා ගැනීමෙන් පසුව එවැනි කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | අදාල අනුමැතීන් ලබා ගත යුතු වීම. |
| (ආ) | විදුලිබල අමාත්‍යාංශයේ ලිඛිත අනුමැතියෙන් ලබා දී තිබුණු වාහන 12 ට අමතරව තවත් වාහන 4 ක් නිසි අනුමැතියකින් තොරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් භාවිතා කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉන්ධන සඳහා රු. 5,723,416 ක් ද, නඩත්තු වියදම් වෙනුවෙන් රු. 10,830,897 ක් ද වශයෙන් රු. 16,554,313 ක වියදමක් වාහන වෙනුවෙන් දරා තිබුණි. එය මුළු පුනරාවර්තන වියදමින් සියයට 16 ක් බව නිරීක්ෂණය විය. වාහන නඩත්තු වියදම් සඳහා වාර්ෂික අයවැයෙන් වෙන්කර දී තිබුණු රු. 8,700,000 ක මූලික ප්‍රතිපාදනයට අමතරව පරිපූරක ඇස්තමේන්තුවෙන් රු. 2,500,000 ක සහ මාරුකිරීම් මඟින් තවත් රු. 1,400,000 ක ප්‍රතිපාදන වෙන්කරවාගෙන තිබුණි. | පැවති Covid – 19 වසංගත තත්වය හේතුවෙන් කාර්යාලයට කැඳවූ සීමිත සේවක පිරිසට ප්‍රවාහන පහසුකම් සැපයීමට මෙම රථ තාවකාලිකව යොදාගෙන ඇත. අමාත්‍යාංශයේ වාහනවලින් වැඩි ප්‍රමාණයක් ව්‍යාපෘති කටයුතු වෙනුවෙන් යොදා ගෙන තිබූ පැරණි වාහන බැවින් නිතර අළුත්වැඩියා කිරීමට සිදුවීම හා ඉන්ධන කාර්යක්ෂමතාව අතින් ඉතා අඩු තත්වයක පැවතීම හේතුවෙන් වාහන අධික වියදමක් දරා නඩත්තු කිරීමට සිදු වී ඇත. | අදාල අනුමැතීන් ලබා ගත යුතු වීම සහ ප්‍රතිපාදන සීමා තුල වියදම් පාලනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | විදුලිබල අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව එම අමාත්‍යාංශයේ ලියාපදිංචිය සහිත වාහනයක වර්ණය වෙනස්කර තිබුණි. වර්ණය වෙනස් කිරීම සහ ප්‍රධාන අළුත්වැඩියාවන් සඳහා අදාල අළුත්වැඩියා කාණ්ඩය යටතේ ලියාපදිංචි වී නොතිබූ සැපයුම්කරුවෙකු ඒ සඳහා තෝරාගෙන තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළ එම ආයතනයට රු. 3,242,150 ක මුදලක් ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ වාහන සඳහා මූලධන වියදම් ප්‍රතිපාදන සලසා දී නොතිබියදී වාහන නඩත්තු වියදම් සඳහා උක්ත (ආ) ඡේදයේ සඳහන් පරිදි අමතර ප්‍රතිපාදන සලසා ගනිමින් මෙම වියදම් දරා තිබුණි. | KQ – 5423 රථය RMV මඟින් විදුලිබල අමාත්‍යාංශයෙන් මෙම අමාත්‍යාංශය වෙත පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සූදානම් කර තිබිය දී Covid – 19 වසංගත තත්වය හේතුවෙන් එම අදාළ කාල සීමාව තුළ දී වාහනය පවරා ගැනීමේ කටයුතු ප්‍රමාද වී ඇත. එවකට පැවති Covid-19 වසංගත තත්වය හේතුවෙන් පැවති ප්‍රායෝගික අපහසුතා සලකා බලා 2020 වර්ෂයේ ලියාපදිංචි කරන ලද සැපයුම්කරුවන් ලැයිස්තුවම 2021 වර්ෂය සඳහාද යොදාගැනීමට අනුමැතිය ලබාගෙන ඇත. රථයේ වර්ණය වෙනස් කිරීම ඇතුළු | අදාල අනුමැතීන් ලබා ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| | | අළුත්වැඩියා වියදම් ලෙස දැරූ රු. 3,242,150.00 ක වියදම ද එම අළුත්වැඩියාව සිදුකල 2020 වර්ෂයේ අනුමත කරගත් සැපයුම්කරුවන් ලැයිස්තුවේ ලියාපදිංචි සැපයුම්කරුවකු වෙත ගෙවීම සිදුකර ඇත. එම මුදල ගෙවීම් කිරීමේදී වැරදීමකින් පුනරාවර්තන වියදමක් ලෙස සළකා කටයුතු කර ඇත. | |
| (ඇ) | අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිතායතනයේ තාක්ෂණික සහයෝගිතා අරමුදලේ (Technical Cooperation Fund) දායක මුදල් ලෙස රාජ්‍ය අමාත්‍යාංශය විසින් යුරෝ 126,194 ක් හෙවත් රු. 29,506,138 ක් ගෙවා තිබුණද, 2020 නොවැම්බර් 25 දිනට අන්තර්ජාතික පරමාණුක බලශක්ති නියෝජිත ආයතනයේ ලිපි ශීර්ෂ යටතේ ඉදිරිපත් කළ ගිණුම් විස්තරය අනුව දායක මුදල යුරෝ 100,450 කි. හිඟ මුදල් ශේෂයන් ශ්‍රී ලංකාව විසින් පවත්වාගෙන යන ගෙවීම් ලේඛණ සමඟ සංසන්දනය කර නිවැරදි බවට තහවුරු කරවාගෙන නොතිබුණි. | 2021 වියදම් වර්ගීකරණය - සම්මත වැය විෂයන්, වැය විෂය කාණ්ඩ හා වැය විෂය නාමයන්ට අදාලව 1505 වැය විෂය “සම්මාදන් සහ දායක මුදල්” වන අතර 1507 වැය විෂය “පළාත් සභා සඳහා ප්‍රදානයන්” වේ. විදුලිබල අමාත්‍යාංශයෙන් රු.මිලියන 28 ට ප්‍රතිපාදනයක් මෙම ගෙවීම සඳහා ලද නමුත් මෙම ගෙවීම සඳහා එම ප්‍රතිපාදනය ප්‍රමාණවත් නෙ◌ාවූණි. එමෙන්ම 2021 වර්ෂයේ වාර්ෂික අයවැය මගින් 1505 වැය විෂය සඳහා අප අමාත්‍යාංශයට ප්‍රතිපාදන වෙන්වී නොතිබුනු අතර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය යටතේ එම වැය විෂය 2021 වර්ෂයට වියදම් දැරීමට අවස්තාව ලබා දුනි. ඒ අනුව මෙම ගෙවීම කිරීම සඳහා මදි වූ ප්‍රතිපාදන ප්‍රමාණය 1404 වැය විෂය යටතේ භාණ්ඩාගාර අනුමැතිය ලබා ගනිමින් 1505 වැය විෂයට මාරු කරමින් අදාල ගෙවීම සිදු කර ඇත. භාවිතා කරන භූමි ප්‍රමාණය මත මාසික ගොඩනැගිලි කුලියෙන් 2/3 විදුලිබල අමාත්‍යාංශය ගෙවීමට එකඟ වීම මත 1404 වැය විෂයේ 2021 වර්ෂයෙදී ප්‍රතිපාදන ඉතිරිවී ඇත. එම ප්‍රතිපාදනයන් ප්‍රමාණයක් 1505 වැය විෂයට මාරු කිරීම සිදු කර ඇති අතර, මුදල් ලද බවට එම ආයතනයෙන් ලදුපත ලබා ගැනීමට කටයුතු කරමි. | අදාල විදේශ ආයතනයෙන් ශේෂ සනාථ කිරීම් ලබාගෙන ණය ශේෂයන් තහවුරු කර ගත යුතු වීම. |
| (ඉ) | ඉහත සඳහන් ගිණුම් විස්තරය අනුව 2020 නොවැම්බර් 25 දිනට ශ්‍රී ලංකා රජයේ සමස්ථ මුල්‍ය වගකීම (Financial Obligation of the Government of Sri Lanka) යුරෝ 455,484 ක් සහ ඇ.ඩො. 234,019 ක් වුවත්, මෙම හිඟ | අදාළ නියමිත කාලවකවානු වලදී දායකමුදල් නිසි පරිදි ගෙවීමට අවශ්‍ය අරමුදල් මෙම අමාත්‍යාංශය සතුව නොතිබීම හේතුවෙන් යුරෝ 455,484 සහ ඇ.ඩො. 234,194 | අදාල විදේශ ආයතනයෙන් ශේෂ සනාථන ලබාගෙන ණය ශේෂයන් තහවුරු කර ගත යුතු |

| | | |
|---|---|---|
| මුදල් සම්බන්ධයෙන් අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය විසින් විධිමත්ව ගිණුම් ලේඛණ පවත්වාගෙන ගොස් නොතිබීම නිසා හිඟ ශේෂවල නිවැරදිතාවය විගණනයට සනාථ කර ගත නොහැකි විය. තවද, මෙම දායක මුදල් අන්තර්ජාතික ආයතන සමඟ එළඹි ගිවිසුම් ප්‍රකාරව කාලීනව ගෙවීමේ වගකීම පවරා ඇති ආයතන හා නිළධාරීන් මෙන්ම, එම මුදල් නිසි පරිදි නොගෙවීමට හේතු සොයා බැලීමට කටයුතු කර නොතිබුණි. ඉදිරියේදී මෙම සංවිධානයේ සමාජිකත්වය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා අදාළ හිඟ මුදල් ගෙවීම හෝ ඒ සඳහා සහනයක් ලබා ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ශේෂයක් පවතී. | වීම සහ අනතර්ජාතික ගිවිසුම් ප්‍රකාරව කාලීනව අදාල සාමාජික මුදල් ගෙවීමට කටයුතු කිරීම. |